දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

# ආයුර්වේද වෛද්‍ය සභාව

## වාර්ෂික වාර්තාව - 2014

# පටුන


| | |
|---|---|
| ආයුර්වේද වෛද්‍ය සභාවේ දැක්ම, මෙහෙවර හා පරමාර්ථය | 4 |
| අභිමතාර්ථ, ආයුර්වේද වෛද්‍ය සභාවේ හැඳින්වීම හා කාර්යභාරය | 5 |
| ආයුර්වේද වෛද්‍ය සභාවේ සාමාජිකයින් 2014 | 6 |
| ආයුර්වේද වෛද්‍ය සභාවේ සංවිධාන ව්‍යුහය | 7 |
| ආයුර්වේද වෛද්‍ය සභාවේ කාර්ය සාධනය | 8 |
| මූල්‍ය සම්පාදනය | 8 |
| ප්‍රතිපත්ති සම්පාදනය හා විමර්ශන හා විශේෂ වෛද්‍ය මණ්ඩල | 9 -10 |
| ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම හා භෛෂජ්‍යකවරුන් ලියාපදිංචි කිරීම, ව්‍යවස්ථා සම්පාදනය, හෙළවෙද රුවනාර වැඩ සටහන | 11 - 15 |
| ආයුර්වේද වෛද්‍ය සභාවේ නිල වෙබ් අඩවිය | 15 - 16 |
| 2014 වර්ෂය තුළ ආයුර්වේද වෛද්‍ය සභාව මගින් ගනු ලැබූ හා ගෙන තිබූ තීරණවලට අනුගතව ක්‍රියාත්මක කරනු ලැබූ වෙනත් පියවර | 16 - 18 |
| 2014 **මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය** | 19 - 21 |
| **2014 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය** | 22 - 23 |
| 2014 මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 24 - 25 |
| 2014 විගණකාධිපති වාර්තාව | 26 -31 |
| සංස්ථාපිත තොරතුරු | 32 |
| ස්තුතිය | 33 |

## දැක්ම

වෘත්තිය ගුණාත්මකභාවය හා
අභිමානය සුරක්ෂිත කරමින්
ශ්‍රී ලංකා ආයුර්වේද ක්ෂේත්‍රයේ උත්තරීතර
ආයතනය බවට පත්වීම.

## මෙහෙවර

වෘත්තිය ආචාරධර්ම වලට අනුගත වූ උපරිම
මහජන සේවාවක් සලසමින්
ආයුර්වේද ක්ෂේත්‍රයේ ගුණාත්මක සංවර්ධනය
සඳහා අවශ්‍ය නෛතික පදනම සුරක්ෂිත කිරීම.

## පරමාර්ථය

1961 අංක 31 දරණ ආයුර්වේද පනතෙහි
විධිවිධාන වලට අනුකූලව ආයුර්වේද ක්ෂේත්‍රයේ
ගුණාත්මක සංවර්ධනය සංස්ථාපනය කිරීමට අවශ්‍ය
දැනුම, කුසලතාවය හා පළපුරුද්ද සහිත
වෘත්තිකයින් වෙත
නෛතික අධිකාරීත්වය පිරිනැමීම
සහ වෘත්තියේ ගරුත්වය සහ ගුණාත්මකභාවය
සුරක්ෂිත කිරීම.

**අභිමතාර්ථ ඃ-**

1. 1961 අංක 31 දරණ ආයුර්වේද පනතින් සභාවට පවරා ඇති බලතල බලාත්මක කිරීම.
2. ආයුර්වේද ක්ෂේත්‍රයේ වෘත්තිමය නිපුණත්වය නඟාලීමට ප්‍රමිති / නිර්ණායක සකස් කිරීම හා පවත්වාගෙන යාම.
3. ආයුර්වේද වෘත්තිකයන්ගේ චර්යාව විධිමත් ලෙස පවත්වා ගැනීමට අවශ්‍ය ආචාරධර්ම හා ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම.
4. ආයුර්වේද ක්ෂේත්‍රයේ වෘත්තිය චර්යාවන් නිර්ණය කිරීම හා පාලනය කිරීම.
5. ආයුර්වේද වෛද්‍ය සභාවේ සම්පත් හා පහසුකම් යාවත්කාලීන කිරීම මඟින් එහි කාර්ය සාධනය වැඩි දියුණු කිරීම.

## 1961 අංක 31 දරණ ආයුර්වේද පනත යටතේ ස්ථාපිත ආයුර්වේද වෛද්‍ය සභාවේ හැඳින්වීම හා කාර්යභාරය

1927 දී රාජ්‍ය මන්ත්‍රණ සභාවේ අනුකාරක සභා නිර්දේශය අනුව 1928 දී පිහිටවනු ලැබූ ස්වදේශීය වෛද්‍ය මණ්ඩලය ශ්‍රී ලාංකේය ආයුර්වේද ක්ෂේත්‍රයේ ප්‍රථම නෛතික අධිකාරී බලය ලත් ආයතනය විය. 1935 අංක 46 දරණ ලංකායුර්වේද වෛද්‍යානුශාසක සභා ආඥා පනත මඟින් ස්ථාපනය කරන ලද ආයුර්වේද වෛද්‍ය සභාව 1941 අංක 17 දරණ ස්වදේශිය වෛද්‍ය ආඥා පනතේ (1945 අංක 49 හා 1949 අංක 49 මඟින් සංශෝධිත) විධිවිධාන යටතේ නැවත ස්ථාපනය කරනු ලැබීය. දැනට ක්‍රියාත්මක ආයුර්වේද වෛද්‍ය සභාව 1961 අංක 31 දරණ ආයුර්වේද පනත යටතේ ස්ථාපනය කරනු ලැබූ ව්‍යවස්ථාපිත ආයතනයකි.

ආයුර්වේද වෛද්‍ය සභාවේ කාර්යභාරය ;

(අ). ආයුර්වේදය උගන්වන යම් ආයතනයක් මේ පනතේ කාර්යයන් සඳහා ඇමතිවරයා විසින් අනුමත කළ යුතුද යන්න ඇමතිවරයාට නිර්දේශ කිරීම.

(ආ). ආයුර්වේද වෛද්‍යවරුන් වශයෙන් තැනැත්තන්ගේ නම් ලියාපදිංචි කිරීම.

(ඇ). ආයුර්වේද ඖෂධ සංයෝජකයන් වශයෙන් තැනැත්තන්ගේ නම් ලියාපදිංචි කිරීම.

(ඈ). ආයුර්වේද සාත්තු සේවකයන් වශයෙන් තැනැත්තන්ගේ නම් ලියාපදිංචි කිරීම.

(ඉ). එසේ ලියාපදිංචි කිරීම් අවලංගු කිරීම හෝ අත්හිටුවීම, හා

(ඊ). 1. ආයුර්වේද වෛද්‍යවරුන, ආයුර්වේද ඖෂධ සංයෝජකයන් හා ආයුර්වේද සාත්තු සේවකයින්ගේ වෘත්තිය හැසිරීම විධිමත් කිරීම හා පාලනය කිරීම සඳහා,


2. මේ වගන්තියේ (ආ) සිට (ඉ) දක්වා ඡේදවල සඳහන් කරුණු වලින් යමක් සඳහා ව්‍යවස්ථා සම්පාදනය කිරීම.

## 2014 වර්ෂයේ 17 හා 18 වන වෛද්‍ය සභාවේ සභා සාමාජිකයින්

| | | | |
|---|---|---|---|
| 1. | **ආයුර්වේද කොමසාරිස්, පී. එස්. කේ. ආර්. වීරකෝන් මයා** | | **සභාපති** |
| 2. | ආචාර්ය, ඩී. ජේ. යූ. පුරසිංහ මයා | | උප සභාපති |
| 3. | වෛද්‍ය ආර්. එල්. රණසිංහ මයා | | ලේඛකාධිකාරී |
| 4. | වෛද්‍ය ඩබ්. එම්. එස්. ජේ. කුමාරි මෙය - අධ්‍යක්ෂ, දේශීය වෛද්‍ය විද්‍යායතනය | | සාමාජික |
| 5. | මහාචාර්ය, ජනිතා ඒ. ලියනගේ මිය අධ්‍යක්ෂ, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය | (2014.05.31 දක්වා ) | සාමාජික |
| 6. | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වෛද්‍ය ඩී. පී. ඒ. දිසානායක මයා | (2014.05.31 දක්වා ) | සාමාජික |
| 7. | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වෛද්‍ය ටී. ඩී. එන්. කරුණාරත්න මයා | (2014.05.31 දක්වා ) | සාමාජික |
| 8. | වෛද්‍ය එස්. එච්. එම්. සේනබණ්ඩා මහතා | | සාමාජික |
| 9. | වෛද්‍ය චන්ද්‍රසිරි විතානාරච්චි මයා | | සාමාජික |
| 10. | එම්. එම්. ඒ. දේව් සිරිවර්ධන මයා | | සාමාජික |
| 11. | වෛද්‍ය ඊ. එම්. පී. බී. ඒකනායක මයා | | සාමාජික |
| 12. | වෛද්‍ය එම්. එම්. ඒ. කේ. අමරසිංහ මයා | | සාමාජික |
| 13. | වෛද්‍ය සුනිල් ශාන්ත විජේතුංග මයා | (2014.05.31 දක්වා ) | සාමාජික |
| 14. | වෛද්‍ය එම්. සෙයිනුදීන් මයා | (2014.05.31 දක්වා ) | සාමාජික |
| 15. | වෛද්‍ය එම්. එම්. කේ. මාලිංගාව මයා | | සාමාජික |
| 16. | **වෛද්‍ය ඩබ්.ඩී. කුමාර මයා** | (2014.06.01 සිට) | **සාමාජික** |
| 17. | **වෛද්‍ය එස්. ජයන්තන් මයා** | (2014.06.01 සිට) | **සාමාජික** |
| 18. | **වෛද්‍ය අයි. ජී. පී. ආර්. කුලනාත මිය** | (2014.06.01 සිට) | **සාමාජික** |
| 19. | **වෛද්‍ය එම්.එච්.එම්. නසීම් මයා** | (2014.06.01 සිට) | **සාමාජික** |
| 20. | **මහාචාර්ය කේ. කේ. ඩී. එස්. රණවීර මයා** | (2014.06.01 සිට) | **සාමාජික** |
| 21. | භාණ්ඩාගාර නිරීක්ෂක, එම්. ආර්. ආර්. අබේවික්‍රම මිය අධ්‍යක්ෂ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව | (2014.05.31 දක්වා ) | සාමාජික |
| 22. | **භාණ්ඩාගාර නියෝජිත සී.එච්. රණතුංග මිය** අධ්‍යක්ෂ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව | (2014.06.01 සිට) | **සමාජික** |

මෙම වර්ෂය තුළ ආයුර්වේද වෛද්‍ය සභා රැස්වීම් 09 ක් පවත්වා ඇත.

## ආයුර්වේද වෛද්‍ය සභාවේ සංවිධාන ව්‍යුහය සාමාජික සංඛ්‍යාව



# ආයුර්වේද වෛද්‍ය සභාවේ කාර්ය සාධනය - 2014

## 01. මූල්‍ය සම්පාදනය


2014 වර්ෂය වෙනුවෙන් ආයුර්වේද වෛද්‍ය සභාව වෙත රුපියල් ලක්ෂ හැත්තැවක (7,000,000/-) මුදලක් රජයේ ප්‍රතිපාදන වශයෙන් ලබා දී ඇත.

2014 වර්ෂයේ ආයුර්වේද වෛද්‍ය සභාව වෙත විවිධ ක්ෂේත්‍රයන් මගින් ලැබූ ආදායම **රු. 5,503,344/-**ක් වූ අතර මුළු වියදම **රු.9,126,977/-** ක් විය. 2013 වර්ෂයේ ආයුර්වේද වෛද්‍ය සභාවේ කාර්ය සාධනය පිළිබඳ වාර්තාවක් ආදායම් වියදම් ගිණුමෙන් ද 2014.12.31 දිනට සභාවේ මූල්‍ය තත්වය පිළිබඳ වාර්තාවක් ශේෂ පත්‍රයෙන් ද ඉදිරිපත් කර ඇත. මීට අමතරව 2014 වර්ෂය තුළ මුදල් ගලා ඒම හා ගලායාම පිළිබඳ තතත්වය මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය මඟින් ඉදිරිපත් කර ඇත.

**වාර්ෂික ආදායම, වියදම හා රජයේ ප්‍රතිපාදන**

| අයිතමය | 2010<br>රුපියල් | 2011<br>රුපියල් | 2012<br>රුපියල් | 2013<br>රුපියල් | 2014<br>රුපියල් |
|---|---|---|---|---|---|
| රජයේ ප්‍රතිපාදන | 6,000,000.00 | 3,900,000.00 | 4,700,000.00 | 5,000,000.00 | 7,000,000.00 |
| උපයාගත් ආදායම | 2,205,626.00 | 1,900,665.00 | 2,361,369.00 | 4,423,774.00 | 5,503,344.00 |
| **මුළු ලැබීම** | **8,205,626.00** | **5,800,665.00** | **7,061,369.00** | **9,423,774.00** | **12,503,344.00** |

ආයුර්වේද වෛද්‍ය සභාවේ 2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා රජයේ ප්‍රතිපාදන හා අනෙකුත් ආදායම් පිළිබඳ විස්තරයක් පහත ප්‍රස්තාරය මඟින් දක්වා ඇත.



## 02. ප්‍රතිපත්ති සම්පාදනය

ආයුර්වේද වෛද්‍ය සභාව මගින් 2014 වර්ෂයේ පහත සඳහන් ස්ථාවර අනුකමිටු ක්‍රියාත්මක කරන ලදී.

- **විභාග පාලක මණ්ඩලය - ස්ථාවර අනු කමිටු**
- **දණ්ඩනීය අවස්ථා පිළිබඳ කාරක සභාව - ස්ථාවර අනු කමිටු**

**විභාග පාලක මණ්ඩලය**

විභාග පාලක මණ්ඩලයේ පූර්ණ අධීක්ෂණය යටතේ පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමේ ලිඛිත පරීක්ෂණය 2014. **නොවැම්බර් මස** 01 හා 02 දිනයන්හි **බොරැල්ල, සුසමයවර්ධන** විද්‍යාලයේ දී පවත්වන ලදී.

**2010 සිට 2014 දක්වා පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම සඳහා සභාව මගින් පවත්වන ලද ලිඛිත පරීක්ෂණ**

| අයිතමය | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|
| ලිඛිත පරීක්ෂණය සඳහා කැඳවූ අයැදුම්කරුවන් සංඛ්‍යාව | 402 | 319 | 231 | 373 | 386 |
| ලිඛිත පරීක්ෂණය සඳහා සහභාගි වූ අයැදුම්කරුවන් සංඛ්‍යාව | 296 | 193 | 151 | 293 | 297 |
| ලිඛිත පරීක්ෂණයෙන් සමත් අයැදුම්කරුවන් සංඛ්‍යාව | 110 | 53 | 51 | 97 | - |
| ලිඛිත පරීක්ෂණයෙන් ඌන සමත් අයැදුම්කරුවන් සංඛ්‍යාව | 49 | 61 | 40 | 79 | - |
| **සහභාගි වූ අයැදුම්කරුවන්ගෙන් සමත්වීමේ ප්‍රතිශතය** | **37.16%** | **27.46%** | **33.77%** | **33.10%** | **ප්‍රතිඵල නිකුත් කර නැත** |

## දණ්ඩනීය අවස්ථා පිළිබඳ කාරක සභාව - ස්ථාවර අනු කමිටුව

දණ්ඩණීය අවස්ථා පිළිබඳ කාරක සභාව 1961 අංක 31 දරණ පනතේ 10, 18 සහ 82 වගන්තිය ප්‍රකාර පනවා ඇති 1973 ආයුර්වේද (විනය) නියෝග වලට අනුගතව පිහිටුවා ඇති ස්ථාවර සභාවකි. එහිදී අනුගමනය කළ යුතු ව්‍යවස්ථානුගත ක්‍රියාවලිය 1973.01.04 දිනැතිව පළ කර ඇති අතර එය සාමාන්‍ය විනය පරීක්ෂණයට බෙහෙවින් සංකීර්ණ වූත් වගකීම් සහිත වූත් නෛතික විමර්ශන ක්‍රියාවලියකි. **2014 වර්ෂයේ දණ්ඩනීය අවස්ථා පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු පැමිණිලි ලැබී නැත.**

## ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන්ගේ අතිරේක සුදුසුකම් නිර්ණය කිරීමේ අනුකමිටුව

1961 අංක 31 දරණ ආයුර්වේද පනතේ 62 වන වගන්තිය අනුව ලියාපදිංචි යම් ආයුර්වේද වෛද්‍යවරයෙකු හට තම ලියාපදිංචියෙන් පසුව ලබා ගන්නා වෘත්තියට අදාළ යම් සුදුසුකමක් අතිරේක සුදුසුකමක් ලෙස සභාව පිළිගත් විට එය නාම ලේඛනයට ඇතුළත් කිරීමේ බලය හිමිවේ. ඒ අනුව එම අතිරේක සුදුසුකම සඳහා සභාව විසින් නිකුත් කරනු ලබන සහතිකයක් දැරීමටත් සිය නම සමඟ ප්‍රදර්ශනය කිරීමටත් එම අතිරේක සුදුසුකම වෘත්තිය කටයුතු සඳහා භාවිතා කිරීමටත්, නෛතික හිමිකම තහවුරු කරනු ලබයි ආයුර්වේද වෛද්‍ය සභා

තීරණය පරිදි මෙම වගන්තියේ විධිවිධාන අනුව අතිරේක සුදුසුකම් ලියාපදිංචි කිරීම ආරම්භ කර ඇති අතර මේ වන විට ඒ පිළිබඳව අදාළ පාර්ශවයන් දැනුම්වත් කර තිබේ.

| අයිතමය | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|
| අතිරේක සුදුසුකම් ඇතුළත් කොට සහතික නිකුත් කර ඇති සංඛ්‍යාව | 05 | 09 | 04 | 03 | 03 |

## 03 විමර්ශන කටයුතු

ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරුන්ගේ වෘත්තය විෂමාචාර මෙන්ම ලියාපදිංචි නොවූ ආයුර්වේද වෛද්‍යවරුන් ලෙස පෙනී සිටින තැනැත්තන් සම්බන්ධයෙන් කරනු ලබන පැමිණිලි සොයා බලා අවශ්‍ය නීතිමය කටයුතු සිදු කිරීම සඳහා ආයුර්වේද වෛද්‍ය සභාවේ මහජන පැමිණිලි විමර්ශන ඒකකයක් පිහිටුවා ඇත. **එමගින්** වෛද්‍යවරුන් විසින් සිදු කරනු ලබන අක්‍රමිකතා, වෘත්තය විෂමාචාර, ආයුර්වේද ආචාරධර්ම වලට පටහැනිව ක්‍රියා කිරීම ආදිය විමර්ශනය මෙහි මූලික අරමුණයී සභාවේ මෙම කාර්යය පුවත්පත් දැන්වීම්, පැමිණිලි හා මහජන පැමිණිලි වශයෙන් වෙන්කොට විමර්ශනය සඳහා යොදා ගැනේ.

| අයිතමය | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|
| විමර්ශනය කර ඇති පැමිණිලි සංඛ්‍යාව | 08 | 14 | 04 | 14 | 39 |

## 04 විශේෂ වෛද්‍ය මණ්ඩලය

රජයේ හා පෞද්ගලික ආයතන වල සේවයේ නියුතු සේවකයින් සඳහා ආයුර්වේද වෛද්‍යවරුන් විසින් නිකුත් කරනු ලබන වෛද්‍ය සහතික සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ xxvi වන පරිච්ජේදයේ 4 වන වගන්තිය අනුව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් පවත්වනු ලබන වෛද්‍ය මණ්ඩලයට සමගාමීව ආයුර්වේද වෛද්‍ය සහතික සම්බන්ධයෙන් අදාළ විශේෂ වෛද්‍ය මණ්ඩල පවත්වනු ලැබේ. ඒ පිළිබඳව සොයා බැලීම සඳහා **ඒ** ආයතන **මගින්** වෛද්‍ය සභාවට පොදු 142 ආකෘති පත්‍රය සම්පූර්ණ කර එවනු ලැබේ.

| අයිතමය | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|
| පවත්වා ඇති විශේෂ වෛද්‍ය මණ්ඩල සංඛ්‍යාව | 05 | 05 | 03 | 04 | 04 |

## 05 පනතේ 55 (1) හා 55 (2) වගන්ති යටතේ ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම

ආයුර්වේද වෛද්‍ය සභාව පහත සඳහන් මූලික ප්‍රතිපත්ති මත වෛද්‍යවරු ලියාපදිංචිය සිදු කරයි.

- ආයුර්වේද වෛද්‍ය උපාධිධාරීන්, අභිඥාණපත්‍රධාරීන් සහ රජය පිළිගත් සහතික පත්‍රධාරීන් සුදුසුකම් අනුව ලියාපදිංචි කිරීම
- ආයුර්වේද වෛද්‍ය සභාව සම්මත කරනු ලැබූ ව්‍යවස්ථාව අනුව සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල හා නිර්දේශ අනුව සුදුසුකම්ලත් පාරම්පරික වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම

සම්මුඛ පරීක්ෂණයේ දී අපේක්ෂකයා ලබා ගන්නා ලකුණු ප්‍රමාණය අනුව ශ්‍රේණිගත කිරීමක් සිදුකරන අතර පරීක්ෂණයෙන් අසමත් වන අයැදුම්කරුවන් ඔවුන්ගේ ලකුණු ප්‍රමාණය අනුව මාස තුනක, මාස හයක හා වසරක් ආදී වශයෙන් ඇගැයුම් කාලයකට යටත් කොට නැවත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

2014 වර්ෂය අවසන් වන විට ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරුන් සංඛ්‍යාව 24049 කි. මෙම වර්ෂය තුළ ආයුර්වේද වෛද්‍යවරුන් 445 දෙනෙකු පහත සඳහන් අංශ අනුව ලියාපදිංචි කර ඇත.

### 2010 සිට 2014 දක්වා පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම සඳහා සභාව මඟින් පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සටහන

| අයිතමය | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|
| වාර්ෂිකව පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සංඛ්‍යාව | 27 | 26 | 20 | 29 | 31 |
| වාර්ෂිකව සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවූ අයැදුම්කරුවන් සංඛ්‍යාව | 450 | 404 | 386 | 461 | 362 |
| වාර්ෂිකව සම්මුඛ පරීක්ෂණ සඳහා සහභාගී වූ අයැදුම්කරුවන් සංඛ්‍යාව | 315 | 315 | 290 | 355 | 296 |
| සම්මුඛ පරීක්ෂණ මඟින් ලියාපදිංචිය සඳහා සුදුසුකම් ලැබූ අයැදුම්කරුවන් සංඛ්‍යාව | 140 | 85 | 136 | 182 | 221 |
| **සහභාගී වූ අයැදුම්කරුවන්ගෙන් සමත් වීමේ ප්‍රතිශතය** | 44.44% | 26.98% | 46.90% | 51.27% | 74.66% |



## 2010 සිට 2014 දක්වා ආයුර්වේද වෛද්‍ය සභාවේ වාර්ෂික ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සංඛ්‍යාව

| අයිතමය | 2010 ලියාපදිංචි සංඛ්‍යාව | 2011 ලියාපදිංචි සංඛ්‍යාව | 2012 ලියාපදිංචි සංඛ්‍යාව | 2013 ලියාපදිංචි සංඛ්‍යාව | 2014 ලියාපදිංචි සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| **සාමාන්‍ය (සර්වාංග)** | | | | | |
| **උපාධිධාරීන්** | **161** | **162** | **135** | **137** | **132** |
| ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය කොළඹ විශ්ව විද්‍යාලය | 85 | 78 | 80 | 67 | 71 |
| ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය කැළණිය විශ්ව විද්‍යාලය | 39 | 61 | 25 | 47 | 30 |
| යුනානි වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය කොළඹ විශ්ව විද්‍යාලය | 24 | 20 | 19 | 17 | 16 |
| සිද්ධ වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය යාපනය විශ්ව විද්‍යාලය | 13 | 03 | 11 | 06 | 12 |
| ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය ඉන්දියාව | - | - | - | - | 03 |
| **ඩිප්ලෝමාධාරීන්** | **91** | **89** | **95** | **76** | **54** |
| ඩීඑච්එම්එස් දේශීය වෛද්‍ය විද්‍යායතනය කොළඹ | - | - | - | - | |
| සිද්ධායුර්වේදඥලාභීන් - ගම්පහ වික්‍රමාරච්චි වෛද්‍ය විද්‍යායතනය | - | - | - | - | |
| ආයුර්වේද ශාස්ත්‍රී | 90 | 77 | 84 | 72 | 54 |
| යාපනය සිද්ධ විද්‍යාලයේ අවසාන වසර සමත් | 01 | 12 | 11 | 04 | |
| **පාරම්පරික සර්වාංග** | **75** | **30** | **45** | **45** | **86** |
| පාරම්පරික | 75 | 30 | 45 | 45 | 86 |
| **පාරම්පරික විශේෂ** | **148** | **68** | **85** | **90** | **178** |
| සර්ප විෂ | 38 | 29 | 27 | 26 | 49 |
| කැඩුම් බිඳුම් | 72 | 30 | 44 | 47 | 92 |
| අක්ෂි රෝග | 04 | 02 | 01 | 01 | 5 |
| චර්ම රෝග | 09 | 02 | 01 | 07 | 7 |
| ගෙඩිවණ | 10 | 01 | 05 | 04 | 8 |
| ජලභීතිකා | 01 | - | - | 01 | 2 |
| දූවුම් පිළිස්සුම් | 05 | 01 | 02 | 02 | 1 |
| මානසික | 09 | 03 | 05 | 02 | 9 |
| හස්ති වෙදකම | | | | | 5 |
| **මුළු එකතුව ( සර්වාංග / විශේෂ )** | **475** | **349** | **360** | **348** | **450** |

## 2014.12.31 දිනට ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි මුළු වෛද්‍යවරුන් සංඛ්‍යාව

| අයිතමය | 2014.12.31 දින වන විට ලියාපදිංචි මුළු සංඛ්‍යාව |
|---|---|
| **සාමාන්‍ය (සර්වාංග)** | |
| **උපාධිධාරීන්** | 2378 |
| එල්ඒඑම්එස් කල්කටා | 52 |
| එෆ්එම්බීඑස් අලහබාද් | 04 |
| ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය කොළඹ විශ්ව විද්‍යාලය | 1194 |
| ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය කැළණිය විශ්ව විද්‍යාලය | 412 |
| යුනානි වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය කොළඹ විශ්ව විද්‍යාලය | 350 |
| සිද්ධ වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය යාපනය විශ්ව විද්‍යාලය | 358 |
| ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය ඉන්දියාව | 08 |
| **ඩිප්ලෝමාධාරීන්** | 5154 |
| ඩීඅයිඑම්එස් දේශීය වෛද්‍ය විද්‍යායතනය කොළඹ | 482 |
| ඩීඒඑම්එස් දේශීය වෛද්‍ය විද්‍යායතනය කොළඹ | 1262 |
| ඩීඑස්ඒසී - ගම්පහ වික්‍රමාරච්චි වෛද්‍ය විද්‍යායතනය | 1166 |
| ඩීඒඑසීසී - ගම්පහ වික්‍රමාරච්චි වෛද්‍ය විද්‍යායතනය | 173 |
| එල්එම් යාපනය සිද්ධ විද්‍යාලය | 56 |
| සිද්ධායුර්වේදඥලාභීන් - ගම්පහ වික්‍රමාරච්චි වෛද්‍ය විද්‍යායතනය | 568 |
| ආයුර්වේද ශාස්ත්‍රී | 1343 |
| යාපනය සිද්ධ විද්‍යාලයේ අවසාන වසර සමත් | 104 |
| **පාරම්පරික සර්වාංග** | 5471 |
| පාරම්පරික | 5471 |
| **පාරම්පරික විශේෂ** | 8507 |
| සර්ප විෂ | 3543 |
| කැඩුම් බිඳුම් | 2321 |
| අක්ෂි රෝග | 632 |
| චර්ම රෝග | 543 |
| ගෙඩිවණ | 372 |
| ජලභීතිකා | 183 |
| දැවුම් පිළිස්සුම් | 83 |
| මානසික | 160 |
| විදුම් පිළිස්සුම් | 07 |
| වෙනත් | 658 |
| හස්ති වෙදකම | 05 |
| **එකතුව ( සර්වාංග / විශේෂ )** | 21510 |
| **තොරතුරු සොයා ගත නොහැකි** | 2544 |
| **මුළු එකතුව (සර්වාංග / විශේෂ / මියගොස් ඇති වෛද්‍යවරුන්)** | 24054 |
| **මියගොස් ඇති සංඛ්‍යාව** | 3001 |

## 06. ආයුර්වේද සාත්තු සේවකයින් හා භෛෂජ්‍යකවරුන් ලියාපදිංචි කිරීම

| අයිතමය | 2011.12.31 දිනට ලියාපදිංචි සංඛ්‍යාව | 2012 | 2013 | 2014 | ලියාපදිංචි මුළු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | | ලියාපදිංචි කර ඇති සංඛ්‍යාව | ලියාපදිංචි කර ඇති සංඛ්‍යාව | ලියාපදිංචි කර ඇති සංඛ්‍යාව | |
| ආයුර්වේද සාත්තු සේවකයින් - හෙද නිලධාරීන් | -- | 30 | -- | -- | 30 |
| භෛෂජ්‍යයකවරුන් | 125 | 44 | 23 | 20 | 212 |

## 07. "හෙළ වෙද රුවනාර"



මහින්ද චින්තන ජාතික වැඩ පිළිවෙල යටතේ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන "හෙළ වෙද පුනරුද" වැඩ සටහනට සමගාමීව ආයුර්වේද වෛද්‍ය සභාවේ මෙහෙයවීමෙන් "හෙළවෙද රුවනාර" වැඩ සටහන ක්‍රියාත්මක කරන ලදී.

ඒ යටතේ,

1. ආයුර්වේද වෛද්‍ය සභාවේ ජංගම සේවා කවුළුවක් මඟින් පහත සඳහන් කටයුතු ඉටු කිරීම.
    - පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචියට අවශ්‍ය අයැදුම්පත් නිකුත් කිරීම
    - පාරම්පරික වෛද්‍යවරුන් ලියාපදිංචියට අදාළ අයැදුම්පත් භාර ගැනීම
    - ලියාපදිංචිය සඳහා එවන ලද අයැදුම්පත් වල අඩුපාඩු සැකසීම
    - ලියාපදිංචි අපේක්ෂිතයින්ගේ ගැටළු විසඳීම
    - ආයුර්වේද වෛද්‍ය සහතික පොත් නිකුත් කිරීම
    - ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා වාහන ලාංජන නිකුත් කිරීම.

- ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා හැදුනුම්පත් නිකුත් කිරීම.
- ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන්ගේ තොරතුරු යාවත් කාලීන කිරීම

2. පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමේ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම.

3. ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා වෘත්තය සංවර්ධන වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම

4. හෙළවෙද රැකවරණ විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක නොවූ වෛද්‍යවරුන් ඒ සඳහා දායක කර ගැනීම සිදු කරන ලදී.

5. වෘත්තය සංවර්ධනය සඳහා වන දේශන මාලා පැවැත්වීම.

## 2010 සිට 2014 දක්වා පැවැත් වූ "හෙළවෙද රුවනාර" වැඩසටහන් පිළිබඳ වාර්තාව

| අයිතමය | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|
| වාර්ෂිකව පවත්වන ලද වෘත්තිය සංවර්ධන වැඩ සටහන් සංඛ්‍යාව - හෙළවෙද රුවනාර | 03 | 04 | 04 | 02 | 01 |


| දිනය | ස්ථානය | සහභාගිත්වය |
|---|---|---|
| 2014.07.24,25,26 | Ayur Ex Kandy - 2014 අන්තර්ජාතික අධ්‍යාපන හා වෙළෙඳ ප්‍රදර්ශනය | 438 |



## 09. ආයුර්වේද වෛද්‍ය සභාවේ නිල වෙබ් අඩවිය

රාජ්‍ය අංශයේ මෙන්ම ව්‍යාපාරික අංශයේ ප්‍රජාවගේ ආයුර්වේද වෛද්‍යවරුන් සම්බන්ධ විශේෂ අවධානය යොමු වී ඇති මෙම කාලසීමාවේ එම කටයුතු පහසු කිරීම සඳහා සහ ආයුර්වේද ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා හා ලියාපදිංචි හා ලියාපදිංචි අපේක්ෂිත ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා අවශ්‍යවන මාර්ගෝපදේශ, නීති රෙගුලාසි හා අනෙකුත් නෛතික තත්තවයන් රාජ්‍ය අංශයේ මෙන්ම ව්‍යාපාරික අංශයේ ප්‍රජාවගේ

අවශ්‍යතාවය අනුව එළිදැක්වීම මෙම වෙබ් අඩවියෙන් අපේක්ෂා කෙරේ. ලියාපදිංචි සියළු වෛද්‍යවරුන්ගෙ තොරතුරු www.ayurvedicmedicoun.gov.lk නිල වෙබ් අඩවිය හරහා අන්තර්ජාලයට **එක් කර** ඇත.




## 10. 2014 වර්ෂය තුළ ආයුර්වේද වෛද්‍ය සභාව මඟින් ගනු ලැබූ හා ගෙන තිබූ තීරණවලට අනුගතව ක්‍රියාත්මක කරනු ලැබූ වෙනත් කටයුතු

1. 1961 අංක 31 දරණ ආයුර්වේද පනතේ 81 වගන්තිය ප්‍රකාරව උප්පැන්න මරණ රෙජිස්ටාර්වරුන් විසින් මියගොස් ඇති බව දන්වා එවා ඇති වෛද්‍යවරුන් ලියාපදිංචි නාමලේඛනයෙන් ඉවත් කිරීම.

| අයිතමය | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|
| මියගොස් ඇති බව දන්වා එවා ඇති වෛද්‍යවරුන් සංඛ්‍යාව | 27 | 27 | 19 | 100 | 67 |

2. රජයේ හා පෞද්ගලික ආයතන වල සේවයේ නියුතු නිලධාරීන් සඳහා ආයුර්වේද වෛද්‍යවරුන් විසින් ලබා දෙනු ලැබූ වෛද්‍ය සහතික තහවුරු කිරීම් සිදුකිරීම.

| අයිතමය | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|
| වෛද්‍ය සහතික තහවුරු කිරීම් සිදු කළ සංඛ්‍යාව | 355 | 250 | 222 | 280 | 1057 |

එක් එක් රාජ්‍ය ආයතන වල විගණන විමර්ශන වලින් සපයා ඇති දත්ත අනුව සාවද්‍ය වෛද්‍ය සහතික නිකුත් කරන සැක සහිත වෛද්‍යවරුන් වෙත දින 14 ක් ඇතුළත ආයුර්වේද වෛද්‍ය සභාවට පැමිණ කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වා ලිපි යොමු කරනු ලැබේ. ඒ සඳහා ප්‍රතිචාර නොදක් වූ වෛද්‍යවරුන් විසින් නිකුත් කරන වෛද්‍ය සහතික පිළිනොගැනීමට කටයුතු කර ඒ බව අදාළ ආයතන දැනුම්වත් කිරීමට කටයුතු කරනු ලැබේ. එමගින් සාවද්‍ය ලෙස නිකුත් කරනු ලබන වෛද්‍ය සහතික අවම කර ගැනීමට හැකි වී ඇත.

3. ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා හැඳුනුම්පත් නිකුත් කර ඇත.

| අයිතමය | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|
| ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම | 541 | 109 | 671 | 495 | 539 |

4. ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා වාහන නිල ලාංඡන නිකුත් කිරීම.

| අයිතමය | 2012 | 2013 | 2014 |
|---|---|---|---|
| වාහන නිල ලාංඡන නිකුත් කිරීම | 335 | 161 | 161 |

5. දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයේ සහයෝගය ඇතිව නවක ලියාපදිංචි වෛද්‍යවරුන් සඳහා මූලික වෘත්තීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

| අයිතමය | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|
| සහභාගි වූ වෛද්‍යවරුන් සංඛ්‍යාව | 117 | 126 | 276 | 136 | 270 |

6. ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා වෛද්‍ය සහතික පොත් නිකුත් කිරීම.

| අයිතමය | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|
| නිකුත් කළ වෛද්‍ය සහතික පොත් සංඛ්‍යාව | 1517 | 1181 | 1256 | 840 | 1063 |

7. ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා ජාත්‍යන්තර සහතික නිකුත් කිරීම.

| අයිතමය | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|
| නිකුත් කළ ජාත්‍යන්තර සහතික සංඛ්‍යාව | 09 | 14 | 12 | 13 | 11 |

ඉහත කරුණු අනුව ආයුර්වේද වෛද්‍ය සභාව 2014 වර්ෂය තුළ එහි පරමාර්ථ ඉටුවන අයුරින් කටයුතු කර ඇති බව සඳහන් කිරීමට කැමැත්තෙමි. වෛද්‍ය සභාවේ පාලනයෙන් තොර හේතු මත ආයුර්වේදය උගන්වන ආයතන ලියාපදිංචි කිරීම වැනි අනෙකුත් අරමුණු ඉටු කිරීමට නොහැකි වූ බවත් එම අරමුණු 2015 වර්ෂයේ දී ඉටු කර ගැනීමට හැකි ලෙස මූලික කටයුතු ආරම්භ කර ඇති බවත් සඳහන් කරමි.

**පී. එස්. කේ. ආර්. වීරකෝන්**
**ආයුර්වේද කොමසාරිස් සහ**
**ආයුර්වේද වෛද්‍ය සභාවේ සභාපති**



2014.08.31 දින

මහරගම,
නාවින්න,
පරණ කොට්ටාව පාරේ,
ආයුර්වේද වෛද්‍ය සභා කාර්යාලයේ දී.

## ආයුර්වේද වෛද්‍ය සභාව

### 2014.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

| විස්තරය | 2013.12.31 | 2014.12.31 |
|---|---|---|
| | රුපියල් | රුපියල් |
| 01. අයභාරය - රජයේ ප්‍රතිපාදන | 5,000,000.00 | 7,000,000.00 |
| 02.වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමේ ගාස්තු - සටහන් 01 | 4,015,550.00 | 5,041,436.00 |
| 03.වෙනත් ආදායම් - සටහන් 02 | 408,224.00 | 461,908.00 |
| | | |
| 04. මුළු ආදායම ( 01 + 02 +03 ) | 9,423,774.00 | 12,503,344.00 |
| | | |
| 05.සාමන්‍ය පොදු වියදම් - සටහන් 03 | 6,969,126.00 | 7,641,362.00 |
| 06.මූල්‍ය වියදම් - සටහන් 04 | 69,651.00 | 129,651.00 |
| 07.වෙනත් වියදම් - සටහන් 05 | 809,727.00 | 1,355,964.00 |
| | | |
| 08. මුළු වියදම ( 05 + 06 + 07) | 7,848,504.00 | 9,126,977.00 |
| 09. වාර්ෂික ඌණතාවය / අතිරික්තය ( 04 - 08 ) | 1,575,270.00 | 3,376,367.00 |

ඉහත සකස් කරන ලද ගිණුම් කරන ප්‍රකාශණය නිවැරදිව හා ඊට අදාල ගිණුම් තැබීම නිවැරදිව සිදු කර ඇති බව සහතික කරමි.

වෛද්‍ය ආර්.එල්.රණසිංහ
ලේඛකාධිකාරී,
ආයුර්වේද වෛද්‍ය සභාව

පී.එස්.කේ.ආර්.වීරකෝන්
සභාපති,
ආයුර්වේද වෛද්‍ය සභාව

සකස් කලේ -
දමිත් කළුආරච්චි
කළමනාකරණ සහකාර
ආයුර්වේද වෛද්‍ය සභාව

සටහන් 01

| විස්තරය | 2013.12.31 | 2014.12.31 |
|---|---|---|
| | රුපියල් | රුපියල් |
| ලියාපදිංචි ගාස්තු | 1,529,250.00 | 1,982,500.00 |
| සම්මුඛ පරීක්ෂණ ගාස්තු | 294,260.00 | 245,250.00 |
| ලියාපදිංචි ඉල්ලුම්පත්‍ර ගාස්තු | 842,285.00 | 1,105,150.00 |
| ලිඛිත පරීක්ෂණ ගාස්තු | 310,700.00 | 356,500.00 |
| වාහන ලාංඡන නිකුත් කිරීමේ ගාස්තු | 81,400.00 | 149,500.00 |
| සහතික පිටපත් ගාස්තු | 24,000.00 | 55,000.00 |
| තැපැල් ආදායම් | 67,345.00 | 69,598.00 |
| වෛද්‍ය සහතික පොත් ගාස්තු | 311,400.00 | 322,776.00 |
| වෛද්‍ය හැඳුනුම්පත් ගාස්තු | 406,500.00 | 608,500.00 |
| නම් වෙනස් කිරීමේ ගාස්තු | 15,500.00 | 15,000.00 |
| නාමලේඛන පිටපත් ගාස්තු | 26,410.00 | 7,662.00 |
| අතිරේක සුදුසුකම් ඇතුළත් කිරීමේ ගාස්තු | 11,500.00 | 14,000.00 |
| ජාත්‍යන්තර සහතික පිටපත් ගාස්තු | 95,000.00 | 110,000.00 |
| | 4,015,550.00 | 5,041,436.00 |

සටහන් 02

| විස්තරය | 2013.12.31 | 2014.12.31 |
|---|---|---|
| | රුපියල් | රුපියල් |
| සේවක ණය පොළී | 49,924.00 | 54,942.00 |
| පාරිතෝෂික ආයෝජන පොළිය | 150,465.00 | 124,411.00 |
| විවිධ ආදායම් | 207,835.00 | 282,555.00 |
| | 408,224.00 | 461,908.00 |

සටහන් 03

| විස්තරය | 2013.12.31 | 2014.12.31 |
|---|---|---|
| | රුපියල් | රුපියල් |
| කාර්ය මණ්ඩල වැටුප් | 3,400,346.00 | 3,128,603.00 |
| දිරි දීමනා | 331,950.00 | 373,550.00 |
| ගණකාධිකාරී දීමනා | | 90,000.00 |
| ලේඛකාධිකාරී දීමනා | | 246,300.00 |
| සේවක අර්ථ සාධක අරමුදල | 373,842.00 | 367,411.00 |
| සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල | 93,460.00 | 91,853.00 |
| වෛද්‍ය හැඳුනුම්පත් ගාස්තු | 52,958.00 | 88,183.00 |
| ලිපිද්‍රව්‍ය වියදම් | 137,572.00 | 220,095.00 |
| සම්මුඛ පරීක්ෂණ මණ්ඩල ගාස්තු | 283,500.00 | 326,550.00 |
| වෛද්‍ය සභා රැස්වීම් ගාස්තු | 508,000.00 | 485,800.00 |
| අතිකාල වියදම් | 273,144.00 | 463,076.00 |
| දුම්රිය අනුග්‍රහ වාර ප්‍රවේශපත්‍ර | 42,270.00 | 39,170.00 |
| අනු කමිටු දීමනා | 59,200.00 | 89,750.00 |
| දුරකතන ගාස්තු | 77,531.00 | 119,034.00 |
| දුම්රිය බලපත්‍ර ගාස්තු | 19,825.00 | 5,050.00 |
| පාරිතෝෂික දීමනා | 255,267.00 | 245,340.00 |
| මුද්‍රණ ගාස්තු | 254,687.00 | 111,586.00 |
| දැන්වීම් ගාස්තු | 82,880.00 | 18,592.00 |
| ලිඛිත පරීක්ෂණ ගාස්තු | 253,675.00 | 281,272.00 |
| කුළිරථ ගාස්තු | 235,700.00 | 576,044.00 |
| ජලබිල්පත් | | 18,050.00 |
| සේවක පුහුණු ගාස්තු | 106,350.00 | 100,000.00 |
| විදුලි ගාස්තු | 126,969.00 | 156,053.00 |
| | 6,969,126.00 | 7,641,362.00 |

සටහන් 04

| විස්තරය | 2013.12.31 | 2014.12.31 |
|---|---|---|
| | රුපියල් | රුපියල් |
| විගණන ගාස්තු | 60,000.00 | 120,000.00 |
| රක්ෂණ ගාස්තු | 9,651.00 | 9,651.00 |
| | 69,651.00 | 129,651.00 |

සටහන් 05

| විස්තරය | 2013.12.31 | 2014.12.31 |
|---|---|---|
| | රුපියල් | රුපියල් |
| විවිධ වියදම් | 95,755.00 | 116,521.00 |
| ගමන් වියදම් | 33,849.00 | 55,594.00 |
| තැපැල් ගාස්තු | 141,455.00 | 133,905.00 |
| සංග්‍රහ වියදම් | 121,723.00 | 180,688.00 |
| පුවත්පත් ගාස්තු | 27,560.00 | 27,445.00 |
| කාර්යාල උපකරණ අළුත්වැඩියා | 98,798.00 | 221,661.00 |
| වාර්ෂික ක්ෂය කිරීම් | 290,587.00 | 620,150.00 |
| | | |
| | 809,727.00 | 1,355,964.00 |

## ආයුර්වේද වෛද්‍ය සභාව

## 2014.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| වත්කම් | 2013.12.31 රුපියල් | | 2014.12.31 රුපියල් | |
|---|---|---|---|---|
| ජංගම වත්කම් | | | | |
| මුදල් ශේෂය | 234,523.00 | | 3,023,685.00 | |
| කාර්යමණ්ඩල ණය | 1,314,914.00 | | 1,259,191.00 | |
| වෛද්‍ය සහතික පොත් තොග ගිණුම | 480,000.00 | | 428,976.00 | |
| ලිපිද්‍රව්‍ය තොගය | 274,938.00 | | 269,698.00 | |
| තැපැල් මුද්දර තොගය | 138,670.00 | | 84,765.00 | |
| ඉදිරියට ගෙවන ලද කාර් උපකරණ | 10,812.00 | | 11,688.00 | |
| | | 2,453,857.00 | | 5,078,003.00 |
| ජංගම නොවන වත්කම් | | | | |
| දේපල, පිරියත හා උපකරණ ( ගත්මිල ) | 4,121,902.00 | | 5,922,096.00 | |
| සමුච්චිත ක්ෂය | 2,647,330.00 | | 3,267,480.00 | |
| දේපල, පිරියත හා උපකරණ (ශුද්ධ අගය) | | **1,474,572.00** | | **2,654,616.00** |
| වෙනත් මූල්‍ය නොවන වත්කම් | | | | |
| පාරිතෝෂික දීමනා ආයෝජන | | **1,423,470.00** | | **1,668,810.00** |
| මුළු වත්කම් | | **5,351,899.00** | | **9,401,429.00** |
| බැරකම් | | | | |
| ජංගම බැරකම් | | | | |
| විගණන ගාස්තු | 120,000.00 | | 240,000.00 | |
| දුරකතන ගාස්තු | 8,015.00 | | 6,466.00 | |
| පුවත්පත් ගාස්තු | 2,380.00 | | 2,280.00 | |
| අතිකාල දීමනා | 10,870.00 | | 40,660.00 | |
| විවිධ වියදම් | 2,399.00 | | 6,512.00 | |
| ඉදිරි වර්ෂය සඳහා ලියාපදිංචි ගාස්තු | 21,500.00 | | | |
| ගෙවිය යුතු ලේඛකාධිකාරී දීමනා | | | 369,450.00 | |
| විදුලි ගාස්තු | 10,103.00 | | 18,268.00 | |
| කාර්ය මණ්ඩල වැටුප් | 1,069.00 | | 4,562.00 | |
| ජල බිල්පත් | | | 3,150.00 | |
| දිරි දීමනා | 19,800.00 | | 58,950.00 | |
| දුම්රිය බලපත්‍ර | 7,465.00 | | 4,455.00 | |
| | | 203,601.00 | | **754,753.00** |

| | | | | |
|---|---|---|---|---|
| ජංගම නොවන බැරකම් | | | | |
| පාරිතෝෂික දීමනා වෙන්කිරීම | | 1,423,470.00 | | 1,668,810.00 |
| මුළු බැරකම් | | 1,627,071.00 | | 2,423,563.00 |
| ශුද්ධ වත්කම් | | 3,724,828.00 | | 6,977,866.00 |
| ශුද්ධ වත්කම් / ස්කන්ධය | | | | |
| ප්‍රාග්ධනය හා සංචිතය | 2,385,073.00 | | 3,837,013.00 | |
| සමුච්චිත ඌණතාවය / අතිරික්තය | 1,575,270.00 | | 3,376,368.00 | |
| | 3,960,343.00 | | 7,213,381.00 | |
| අඩු කළා / එකතු කළා | | | | |
| පෙරවර්ෂ ගැලපුම් ගිණුම | 235,515.00 | | 235,515.00 | |
| මුළු ශුද්ධ වත්කම්/ස්කන්ධය | | 3,724,828.00 | | 6,977,866.00 |

ඉහත සකස් කරන ලද ගිණුම්කරණ ප්‍රකාශනය නිවැරදිව හා ඊට අදාල ගිණුම් තැබීම නිවැරදිව සිදු කර ඇති බව සහතික කරමි.

වෛද්‍ය, ආර්.එල්.රණසිංහ
ලේඛකාධිකාරී,
ආයුර්වේද වෛද්‍ය සභාව

පී.එස්.කේ.ආර්.වීරකෝන්
සභාපති,
ආයුර්වේද වෛද්‍ය සභාව

සකස් කළේ
දමිත් කළුආරච්චි
කළමනාකරණ සහකාර
ආයුර්වේද වෛද්‍ය සභාව

# ආයුර්වේද වෛද්‍ය සභාව

## 2014.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2013 වර්ෂය | | | 2014 වර්ෂය | | |
|---|---|---|---|---|---|---|
| | අඩුවීම් | එකතුවීම් | | අඩුවීම් | එකතුවීම් | |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ආදායම | | | | | | |
| පොලී ආදායමට පෙර අතිරික්තය | | | **1,575,270.00** | | | **3,376,368.00** |
| මුදල් චලනය කෙරෙහි බල නොපාන විෂයන් ගැලපීම | | | | | | |
| කාර්ය මණ්ඩල ණය පොලී | 49,924.00 | | | 54,942.00 | | |
| පාරිතෝෂික ආයෝජන පොළිය | 150,465.00 | | | 124,411.00 | | |
| වාර්ෂික ක්ෂය | | 290,587.00 | | | 620,150.00 | |
| සංචිත වෙනස්වීම | 8,265.00 | | | 123,330.00 | | |
| පෙරවර්ෂ ගැලපුම් ගිණුම | 235,515.00 | | | | | |
| විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | | 255,267.00 | | | 245,340.00 | |
| | 444,169.00 | 545,854.00 | **101,685.00** | 302,683.00 | 865,490.00 | **562,807.00** |
| **මෙහෙයුම් අතිරික්තය** | | | **1,676,955.00** | | | **3,939,175.00** |
| කාරක ප්‍රාග්ධන විෂයන්ගේ වෙනස්වීම. | | | | | | |
| ණය ගැතියෝ | 477,314.00 | | | | 55,723.00 | |
| තොගය ( ලිපිද්‍රව්‍ය ) | 99,288.00 | | | | 5,240.00 | |
| තැපැල් මුද්දර තොගය | 108,545.00 | | | | 53,905.00 | |
| වෛද්‍ය සහතික පොත් තොග ගිණුම | 480,000.00 | | | | 51,024.00 | |
| විගණන ගාස්තු | | 57,792.00 | | | 120,000.00 | |
| උපචිත දුරකතන ගාස්තු | | 3,299.00 | | 1,549.00 | | |
| උපචිත විවිධ වියදම් | | 2,399.00 | | | 4,113.00 | |
| ඉදිරි වර්ෂය සඳහා ගෙවීම් කාර්. උපකරණ | 10,812.00 | | | 876.00 | | |
| උපචිත ජල ගාස්තුව | | | | | 3,150.00 | |
| උපචිත පුවත්පත් ගාස්තු | 100.00 | | | 100.00 | | |
| උපචිත අතිකාල ගාස්තු | 4,226.00 | | | | 29,790.00 | |
| උපචිත දුම්රිය බලපත්‍ර ගාස්තු | | 1,085.00 | | 3,010.00 | | |
| උපචිත ලිඛිත පරීක්ෂණ ගාස්තු | | | | | | |
| උපචිත දිරි දීමනා | | 19,800.00 | | | 39,150.00 | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| උපචිත කාර්යමණ්ඩල වැටුප් | 7,931.00 | | | | 3,493.00 | |
| උපචිත හැඳුනුම්පත් ගාස්තු | | | | | | |
| ඉදිරිවර්ෂය සඳහා ලි.ප.ගාස්තු | 31,500.00 | | | 21,500.00 | | |
| උපචිත විදුලි ගාස්තු | | 2,039.00 | | | 8,165.00 | |
| උපචිත ලේඛකාධිකාර් දීමනා | | | | | 369,450.00 | |
| දැන්වීම් ගාස්තු | 78,400.00 | | | | | |
| | 1,298,116.00 | 86,414.00 | **(1,211,702.00)** | 27,035.00 | 743,203.00 | **716,168.00** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | | **465,253.00** | | | **4,655,343.00** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | | | | | |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම | 197,960.00 | | | 1,800,194.00 | | |
| පාරිතෝෂික ආයෝජන පොළිය | | 150,465.00 | | | 124,411.00 | |
| පාරිතෝෂික දීමනා | 255,267.00 | | | 245,340.00 | | |
| | 453,227.00 | 150,465.00 | **(302,762.00)** | 2,045,534.00 | 124,411.00 | **(1,921,123.00)** |
| මුදල් හා සමාන විෂයන්ගේ අඩුවීම | | | **162,491.00** | | | **2,734,220.00** |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය | | | | | | |
| කාර්ය මණ්ඩල ණය පොලී | | | **49,924.00** | | | **54,942.00** |
| | | | **212,415.00** | | | **2,789,162.00** |
| වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් හා සමාන විෂයන් | | | | | | |
| බැංකු ගිණුම | | | **22,108.00** | | | **234,523.00** |
| වර්ෂය අවසානයේ ශුද්ධ මුදල් ප්‍රවාහය | | | **234,523.00** | | | **3,023,685.00** |
| වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් හා සමාන විෂයන් | | | | | | |
| බැංකු ගිණුම | | | **234,523.00** | | | **3,023,685.00** |
| **වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් සමාන විෂයන්ගේ අඩුවීම** | | | **234,523.00** | | | **3,023,685.00** |

ඉහත සකස් කරන ලද ගිණුම්කරණ ප්‍රකාශනය නිවැරදිව හා ඊට අදාල ගිණුම් තැබීම නිවැරදිව සිදු කර ඇති බව සහතික කරමි.

සකස් කලේ :- දමිත් කළුආරච්චි

කළමනාකරණ සහකාර - ආයුර්වේද වෛද්‍ය සභාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. එච්එම්/සී/ඒඑම්සී/1/14/25 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2016 පෙබරවාරි 10 දින

සභාපති,

ආයුර්වේද වෛද්‍ය සභාව.

**ආයුර්වේද වෛද්‍ය සභාවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ආයුර්වේද වෛද්‍ය සභාවේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 3 කොටසෙහි 11-21 දක්වා වගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් වෛද්‍ය සභාවේ සභාපති වෙත 2015 සැප්තැම්බර් 29 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණය මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ආයුර්වේද වෛද්‍ය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පසුගිය වර්ෂයේ සිට පැවත එන රු.235,515 ක හඳුනා නොගත් හර ශේෂය හඳුනාගෙන නිවැරදි කිරීම වෙනුවට ස්කන්ධ ප්‍රාග්ධනයෙන් අඩුකර දක්වා තිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 111 වන කොටසේ 11(1)(ඉ) වගන්තිය. | ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරු තිදෙනෙකු සභාවේ සාමාජිකයන් ලෙස පත් කළ යුතු නමුත් සමාලෝචිත වර්ෂය දක්වාම සාමාජිකයන් පත්කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2005 ජුලි 05 දිනැති අංක 14/13/08 (3) දරන ආයුර්වේද වෛද්‍ය සභා පත්‍රිකාව | ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි සියළුම වෛද්‍යවරුන් වර්ෂ 05 කට වරක් ලියාපදිංචිය යාවත්කාලීන කරගතයුතු නමුත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ලියාපදිංචි කාලය වසර 5 ඉක්ම වූ වෛද්‍යවරුන් 19,528 න් එක් වෛද්‍යවරයෙකු පමණක් ලියාපදිංචිය යාවත්කාලීන කර තිබුණි. සියළුම වෛද්‍යවරුන් මේ සඳහා පෙළඹවීමට සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබීම හේතුවෙන් ව්‍යාජ වෛද්‍යවරුන් කර්මාන්තයේ නියැලීමට ඉඩකඩ පවතින බව නිරීක්ෂණය විය. |

(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

(i) මුදල්රෙගුලාසි 169(2) — රජයට ලැබෙන මුදල් ඇණවුමක් වෙනුවෙන් එහි සඳහන් මුළු මුදලම උපලබ්ධි වන තුරු කිසිම සේවයක් ඉටුකරදීම නොකළ යුතු වුවත් මුදල් ඇණවුම් උපලබ්ධි කරගැනීමට කටයුතු කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී රු.33,820 ක සේවා සපයා තිබුණි.

(ii) මුදල් රෙගුලාසි 177(1) — රාජ්‍ය ආදායමේ කොටසක් ලෙස එකතුකර ගන්නා රජයේ මුදල් දිනපතා හෝ හැකිතාක් ඉක්මනින් බැංකුගත කළ යුතු නමුත් සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.110,920 ක මුදලක් බැංකුගත කිරීම සඳහා සති 01 සිට සති 02 දක්වා ප්‍රමාද කර තිබුණු බව නියැදි විගණන පරීක්ෂණයකදී අනාවරණය විය.

(ඈ) 2013 ජූනි 04 දිනැති අංක ඩීඑම්ස්/ඊ3/38/4/241/1-(වෙලුම) 1 දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය — වෛද්‍ය සභාවේ කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකුට මාසයකට රු.1,800 ක උපරිමයකට යටත්ව දිරි දීමනා ගෙවීම අනුමත කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් 10 දෙනෙකුට එම සීමාව ඉක්මවා එකතුව රු.148,300 ක දිරි දීමනා ගෙවා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේදී සභාවේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.3,376,367 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,575,270 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,801,097ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව රජයේ ප්‍රතිපාදන සියයට 40 ක් හෙවත් රු.2,000,000 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලය වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

### 4.1 කාර්යසාධනය

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

(අ) වෛද්‍ය සභාව විසින් සමාලෝචිත වර්ෂය තුළදී ස්වර්ණ මුද්‍රිකා පිරිනැමීමේ වැඩසටහන් 08 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද ඉන් කිසිදු වැඩසටහනක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ හා පසුගිය වසර හතරක එක් එක් වර්ෂයේ වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම පහත දැක්වේ.

| වෛද්‍යවරුන් | 2014 | 2013 | 2012 | 2011 | 2010 |
|---|---|---|---|---|---|
| උපාධිධාරී | 132 | 137 | 135 | 162 | 161 |
| ඩිප්ලෝමාධාරී | 54 | 76 | 95 | 89 | 91 |
| පාරම්පරික | 86 | 45 | 45 | 30 | 75 |
| පාරම්පරික විශේෂ | 178 | 90 | 85 | 68 | 148 |
| | 450 | 348 | 360 | 349 | 475 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

2012 වර්ෂයේ සිට ඩිප්ලෝමාධාරී වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව ක්‍රමයෙන් අඩුවී තිබුණු අතර 2013 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ඩිප්ලෝමාධාරී වෛද්‍යවරුන් සංඛ්‍යාව 22 කින් හෙවත් සියයට 29 ක ප්‍රතිශතයකින් අඩුවී තිබුණි.

**5.3 අභ්‍යන්තර විගණනය**

2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ජ්/2009(1) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොතිබුණු අතර ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය මගින් හෝ විගණනය සිදුකර නොතිබුණි.

**5.4 විගණන කමිටු**

2010 දෙසැම්බර් 14 දිනැති අංක 55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා විගණන කමිටු පිහිටුවා නොතිබුණි.

**5.5 අයවැය ලේඛනමය පාලනය**

සමාලෝචිත වර්ෂයේ වියදම්, අයවැයගත වියදම් සමග සැසඳීමේදී සියයට 4 සිට සියයට 84 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**5.6 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

වෛද්‍ය සභාවේ 2013 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2015 සැප්තැම්බර් 18 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයුර්වේද වෛද්‍ය සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) අලෙවි පාලනය

(ආ) මූල්‍ය පාලනය

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති

7

## සංස්ථාපිත තොරතුරු

නම -ආයුර්වේද වෛද්‍ය සභාව

ව්‍යවස්ථාපිත තත්වය -

1927 දී රාජ්‍ය මන්ත්‍රණ සභාවේ අනුකාරක සභා නිර්දේශය අනුව 1928 දී පිහිටවනු ලැබූ ස්වදේශීය වෛද්‍ය මණ්ඩලය ශ්‍රී ලාංකේය ආයුර්වේද ක්ෂේත්‍රයේ ප්‍රථම නෛතික අධිකාරී බලය ලත් ආයතනය විය. 1935 අංක 46 දරන ලංකායුර්වේද වෛද්‍යනුශාසක සභා ආඥා පනත මඟින් ස්ථාපනය කරන ලද ආයුර්වේද වෛද්‍ය සභාව 1941 අංක 17 දරන ස්වදේශිය වෛද්‍ය ආඥා පනතේ (1945 අංක 49 හා 1949 අංක 49 මඟින් සංශෝධිත) විධිවිධාන යටතේ නැවත ස්ථාපනය කරනු ලැබීය. දැනට ක්‍රියාත්මක ආයුර්වේද වෛද්‍ය සභාව 1961 අංක 31 දරණ ආයුර්වේද පනත යටතේ ස්ථාපනය කරනු ලැබූ ව්‍යවස්ථාපිත ආයතනයකි.

බැංකුකරුවෝ -

1. ලංකා බැංකුව, ( ප්‍රධාන බැංකුකරු )
මහරගම

2. ජාතික ඉතිරි කිරීමේ බැංකුව,
ඉතුරුම් නිවස,
ප්‍රධාන කාර්යාලය,
කොල්ලුපිටිය.

විගණකයින් -

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
නො.306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල.


සභාපති / தலைவர் / Chairman 011-2847555
ලේඛකාධිකාරී / பதிவாளர் / Registrar 011-5672906 011-2746754
කාර්යාලය / காரியாலயம் / Office 011 -5672905 011 -2896911- 1 Ext. 315/316/321
Web site :- www.ayurvedicmedicoun.gov.lk E mail :- ayurmc@sltnet.lk

# ස්තූතිය

ගරු දේශීය වෛද්‍ය අමාත්‍යතුමා

ගරු දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

දේශීය වෛද්‍ය ලේකම්තුමා

ආයුර්වේද වෛද්‍ය සභාවේ සියළුම සාමාජික භවතුන්

දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

ආයුර්වේද දෙපාර්තමේන්තුව

දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය

බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය

පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ

සියළුම පළාත් ආයුර්වේද කොමසාරිස්වරුන්

විගණකාධිපති දෙපාර්තමේන්තුව

නීතිපති දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව

සියළුම ජනමාධ්‍ය ආයතන

සියළුම දිස්ත්‍රික් ලේකම් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල

සියළුම ප්‍රාදේශීය ආයුර්වේද සංරක්ෂණ සභා

හා

**ආයුර්වේද වෛද්‍ය සභා කාර්ය මණ්ඩලය**

